මොරටුව විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

# කාර්ය මණ්ඩල ආපනශාලාව සඳහා සේවා සැපයීම

මොරටුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල ආපනශාලාව 2026/2027 වර්ෂයේ දෙසැම්බර් මස සිට වසරක කාලයක් පවත්වාගෙන යාම සඳහා මුද්‍රා තබන ලද ලංසු පත් 2026.10.20 ප.ව. 2.30 දක්වා භාරගනු ලැබේ.

ඉහත සඳහන් ආපනශාලාව සඳහා ආපසු ගෙවනු නොලබන රු. 500.00 ක ලංසු ගාස්තුවක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පත විශ්වවිද්‍යාලයේ සුභසාධක අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අදාළ ලංසු 2026.10.05 දින සිට 2026.10.19 දින දක්වා කාර්යාලයීය දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැක.

මුද්‍රා තබන ලද ලංසු, පළමු පිටපත සහ දෙවන පිටපත ලෙස වෙන් වෙන්ව ලියුම් කවර දෙකක බහා, එම පිටපත් දෙකම එකම කවරයක බහා 2026.10.20 දින ප.ව. 2.30 ට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපැලෙන් ලැබෙන පරිදි,

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,**
**සුභසාධක අංශය,**
**මොරටුව විශ්වවිද්‍යාලය,**
**කටුබැද්ද, මොරටුව.**

යන ලිපිනයට එවීම හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ නව පරිපාලන ගොඩනැගිල්ලේ බිම්මහලෙහි පිහිටි සුභසාධක අංශයේ තබා ඇති ලංසු බහාලන පෙට්ටියට පෞද්ගලිකව පැමිණ බහාලීම කළ යුතුය. සියලුම ලංසු සමඟ විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවනු ලැබූ රු. 5,000.00ක ආපසු ගෙවනු ලබන ලංසු ආරක්ෂක ලදුපතක් ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලංසු පත ප්‍රතික්ෂේප කෙරේ. ලංසු පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ **"කාර්ය මණ්ඩල ආපනශාලා ලංසු පත්‍රය"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය බව සැලකිය යුතුය. විකල්ප ලංසු පත්‍ර භාරගනු නොලැබේ.

ලංසු පත්‍ර 2026.10.20 දින ප.ව. 2.30 දක්වා භාරගනු ලබන අතර ලංසු පත්‍ර භාර ගැනීම අවසන් වූ විගස සුභසාධක අංශයේ රැස්වීම් ශාලාවේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද, මොරටුව.